# ජයන්ත සමරවීර

## ஜயந்த சமரவீர | JAYANTHA SAMARAWEERA

**ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් සහ බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍ය**

களஞ்சிய வசதிகள், முனைய மேடைகள், துறைமுக வழங்கல் வசதிகள், படகுகள் மற்றும் கப்பற்றுறை கைத்தொழில் அபிவிருத்தி தொடர்பான இராஜாங்க அமைச்சர்

**State Minister of Warehouse Facilities, Container Yards, Port Supply Facilities & Boats and Shipping Industry Develpoment**

---

**ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් සහ බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

களஞ்சிய வசதிகள், முனைய மேடைகள், துறைமுக வழங்கல் வசதிகள், படகுகள் மற்றும் கப்பற்றுறை கைத்தொழில் அபிவிருத்தி தொடர்பான இராஜாங்க அமைச்சு

**State Ministry of Warehouse Facilities, Container Yards, Port Supply Facilities & Boats and Shipping Industry Develpoment**


---

| මගේ අංකය / எனது இல / My No. | 2021/MOHEL/007 | ඔබේ අංකය / உமது இல / Your No. | | දිනය / திகதி / Date | 2021.09.13 |
|---|---|---|---|---|---|

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා
සෞඛ්‍ය අමාත්‍ය
සෞඛ්‍ය අමාත්‍යාංශය,
අංක 385, සුවසිරිපාය,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ගරු අමාත්‍ය තුමනි,

<u>පානදුර කොවිඩ් 19 මර්ධන ස්වේච්ඡා වැඩසටහනට බාධා එල්ලවීම</u>

කොවිඩ් දෙවන රැල්ල ඇතිවන විට අප පානදුර ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපති ධූරයේ වගකීම භාරගෙන තිබුණි. පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යනු වාද්දුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය ලෙස ග්‍රාමසේවා වසම් 20 කින්ද, පානදුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය ලෙස ග්‍රාමසේවා වසම් 52 කින්ද ලෙස ග්‍රාම සේවා වසම් 72 කින් යුත් නාගරික ප්‍රදේශයකි.

මෙම අවස්ථාවේදී කොවිඩ් කළමනාකරණ කටයුතු වෙනුවෙන් පානදුර ප්‍රාදේශීය සංවර්ධන කමිටුව ප්‍රදේශීය කොවිඩ් කමිටුව ලෙස පරිවර්තනය වුණි. අපගේ සභාපතිත්වයෙන් මෙම කමිටුව කැඳවූ අතර හිටපු පළාත්සභා මන්ත්‍රී ජගත් අංගගේ මහතාගේ උප සභාපතිත්වයෙන් එතුමා ඇතුළු හිටපු පළාත් මන්ත්‍රිවරු තිදෙනෙක්, පානදුර නගරසභාවේ සභාපතිතුමා, පානදුර ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා, පානදුර ප්‍රාදේශීය ලේකම්තුමිය ඇතුළු අදාළ කාර්ය මණ්ඩලය, පානදුර හා වාද්දුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයන්ගේ නියෝජනයන්, පානදුර මූලික රෝහලේ අධිකාරී හෝ නියෝජනයක්, පානදුර කේතුමතී රෝහලේ අධිකාරී හෝ නියෝජනයක්, පානදුර සහකාර පොලිස් අධිකාරී හෝ නියෝජනයක් කමිටුව තුළ නියෝජනය විය.

අවශ්‍යතාව පරිදි මාසයකට වරක්, දෙසතියකට වරක්, සතියකට වරක් හා සතියකට දෙවරක් ලෙසත් රැස්වීම් පවත්වමින් ප්‍රදේශයේ කොවිඩ් මර්ධනය වෙනුවෙන් කමිටුව ක්‍රියාත්මක විය. කමිටු සඳහා වාද්දුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය රංජන් මහතාත්, පානදුර අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය දර්ශන මහතාත් ඇතැම් අවස්ථාවල වෙනත් නියෝජිතයකුත් සහභාගි වෙමින් ඉතාමත් කාර්යක්ෂමව දත්ත හා තොරතුරු ලබාදෙමින් කටයුතු කළ අතර කමිටුව එම තොරතුරු විමර්ශනය කරමින්, සමාලෝචනය කරමින් රෝගී සත්කාරක සේවා, එන්නත්කරණය, පී.සී.ආර් පරීක්ෂණ ආදිය සඳහා පහසුකම් සපයමින්, මෘතශරීර ආදාහන කටයුතු සම්බන්ධීකරණය කරමින්, නිරෝධායනය වන හා රෝගීන් සිටින නිවාස වෙත රජයේ සහන සේවා සපයමින්, සංචරණ සීමා වලදී වෙළඳ බලපත්‍ර ලබාදීම විධිමත් කරමින්, නගරයේ යාචකයන් වෙනුවෙන් විශේෂ මැදිහත්වීම් කරමින් මෙම කාලය තුළ පානදුර කොවිඩ් මර්ධන කටයුතු සාර්ථක කරගැනීමට කටයුතු කරන ලදී.


| කාර්යාලය \| அலுவலகம் \| OFFICE | | | නිවස \| வீடு \| RESIDENCE | පුද්: කාර්යාලය \| பிரத்தியேக அலுவலகம் \| PRIVATE OFFICE | |
|---|---|---|---|---|---|
| දුරකථනය / தொலைபேசி / TELEPHONE | ෆැක්ස් / தொலைநகல் / FAX | ඊ තැපැල් / மின்னஞ்சல் / E MAIL | දුරකථනය / தொலைபேசி / TELEPHONE | දුරකථනය / தொலைபேசி / TELEPHONE | ඊ තැපැල් / மின்னஞ்சல் / E MAIL |
| +94 112 54 28 90 | +94 112 32 06 62 | minister@domoin.lk | +94 382 29 47 05 | +94 342 238 420 \| +94 342 2321 180 | jskalutara@gmail.com |

කාර්යාලය: අංක 45, ලේඩින් බැස්තියන් පාර, කොළඹ 01.
அலுவலகம்: இல: 45, லேடன் பெஸ்தியன் வீதி, கொழும்பு 01, இலங்கை.
Office : No. 45, Layden Bastiyan Road, Colombo 01, Sri Lanka.

නිවස: මාවල දකුණ, වාද්දුව.
வீடு: மாவல தற்கு, வாத்துவை
Res : Mawala South, Wadduwa.


Scanned with CamScanner

එසේ තිබියදී පසුගිය අප්‍රේල් මස සිට රටතුළ තුන්වන කොවිඩ් රැල්ලක් නිර්මාණය වන්නට වූ අතර අප පානදුර ප්‍රදේශයටද එහි බලපෑම උත්සන්නව දැනෙන්නට විය.

මෙම තත්ත්වය තුළ කොවිඩ් රෝගීන්ට වඩා කාර්යක්ෂම හා බලපෑම් සහගත සේවාවක් ලබාදීම වෙනුවෙනුත්, රජයේ හා සෞඛ්‍ය කාර්යමණ්ඩල වල පීඩනය අඩුකිරීම වෙනුවෙනුත් දැනට නිළ වශයෙන් පවතින සහන සේවා හා සත්කාරක සේවා වලට අමතරව පරිත්‍යාගශීලීන් හා ස්වේච්ඡා කණ්ඩායම් සම්බන්ධ කරගෙන කළහැකි යමක් ඇත්ද යන්න පිළිබඳ අපගේ අවධානය යොමුවිය.

මෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රදේශයේ පරිත්‍යාගශීලීන්ගේ ආධාර ඇතිව ''පිහිට - බෝසත් මිනිස් සාමූහිකය'' නම් ස්වේච්ඡා සංවිධානය හරහා පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිවෙස් වල ප්‍රතිකාර ලබමින් සිටින වයස අවුරුදු හැටට වැඩි, පෞද්ගලිකව ඔක්සි මීටර සපයාගත නොහැකි සෑම ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකුටම ඔක්සි මීටර නිවෙසටම ගොස් නොමිලේ ලබාදීමට හැකියාව ලැබුණි. එමගින් ජීවිත ගණනාවක් බේරාගැනීමට හැකිවූ බව නියතය.

මේ අතර අප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ හඳුනාගත් රෝගී සංඛ්‍යාව 2000 ඉක්මවූ අතර නිවෙස් වල කළමනාකරණය කරන රෝගීන් සංඛ්‍යාව 1500 ඉක්මවා යමින් තිබුණි. නිවෙස් තුළ කළමනාකරණය කරන රෝගීන් වෙනුවෙන් උපදෙස් ලබාදීම සඳහා රජය විසින් හඳුන්වා දී ඇති 1390 දුරකතන අංකය කාර්යබහුල වීම මෙම රෝගීන් මුහුණ දුන් පොදු ගැටලුවක් බවට පත්වන්නට විය.

එසේ තිබියදී පවතින තීරණාත්මක තත්ත්වය සලකා බලා නිවෙස් තුළ කළමනාකරණයට යොමුකර සිටින රෝගීන්ට වෛද්‍ය සහාය ලබාදීමේ විකල්ප වැඩපිළිවෙළක් ''පානදුර කොවිඩ් රෝගීන් රැකබලාගැනීමේ ස්වේච්ඡා ව්‍යාපෘතිය'' නමින් අප විසින් අගෝස්තු 27 වන දින ප්‍රාදේශීය කොවිඩ් කමිටුවට යෝජනා කරන ලදී. ඊට කමිටුවේ ඒකමතික එකඟතාව ලැබුන අතර එය 2021 සැප්තැම්බර් 13 වන දින ආරම්භ කිරීමට නියමිතව තිබුණි. එයට අවශ්‍ය සංවිධාන කටයුතු ළඟි ළඟියේ සූදානම් කිරීමට පානදුර රෝහලත්, පානදුර, වාද්දූව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලත්, පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත්, මහජන නියෝජිතයන් ලෙස අපත් කටයුතු කරමින් සිටියෙමු.

''පානදුර කොවිඩ් රෝගීන් රැකබලාගැනීමේ ස්වේච්ඡා ව්‍යාපෘතිය'' හෙවත් කොවිඩ් කමිටුව දියත් කිරීමට සැලසුම් කළ වැඩසටහන යටතේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ස්ථිර පදිංචිය දරණ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෛද්‍යවරු ස්වේච්ඡාවෙන් ඔවුන් පදිංචි ග්‍රාම නිලධාරි කොට්ඨාශය හෝ සමීප කොට්ඨාශවල රෝගීන් ප්‍රමාණයක් භාරගෙන දුරකතන මගින් රෝගී තත්ත්වයන් පිළිබඳ විමසීම් කර අවශ්‍ය උපදෙස් ලබාදෙමින් අවශ්‍ය රෝගීන් රෝහල් ගත කිරීමට මැදිහත් වීමටත්, පානදුර රෝහල තුළ විශේෂ ඇමතුම් මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමටත්, රෝගීන් ප්‍රවාහනය කිරීම සඳහා දිවා රාත්‍රී ක්‍රියාත්මක ස්වේච්ඡා ක්‍රියාකාරීන්ගේ වාහන දෙකක් යෙදවීමටත් කටයුතු සම්පාදනය වෙමින් පැවතුණි.

ප්‍රදේශයේ මහජන නියෝජිතයා ලෙසත්, මහජන සේවකයකු ලෙසත් අප පෞද්ගලිකවම දුරකතන මාර්ගයෙන් වෛද්‍යවරුන්ට අපගේ වැඩපිළිවෙළ කුමක්ද යන්නත්, එහි අවශ්‍යතාව කොපමණද යන්නත් පැහැදිලි කළ අතර ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය දරන වෛද්‍යවරු 280 න් 203 ක පිරිසක් මෙම සද්කාර්යය සඳහා එකඟතාව ලබාදෙන ලදී. පරිත්‍යාගශීලීන් දෙදෙනකු රෝගී ප්‍රවාහනය සඳහා පානදුර රෝහලට වාහන දෙකක් අනුයුක්ත කිරීමට ඉදිරිපත් වූ අතර ස්වේච්ඡා රියදුරන් හතර දෙනෙක් හා අට දෙනෙකුගෙන් යුතු සහායක කාර්යමණ්ඩලයක්ද දිවා රෑ සේවය කිරීමට මෙම වැඩපිළිවල හා එක්වන ලදී.

කෙසේ වුවද සියල්ල සාර්ථකව සංවිධානය වෙමින් තිබියදී 2021 සැප්තැම්බර් 09 වන දින පානදුර හා වාද්දූව සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලවලින් කොවිඩ් කමිටුවේ සභාපතිවරයා වන අප අමතමින් කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ විසින් මෙම ස්වේච්ඡා වැඩපිළිවළට සහාය නොදෙන ලෙස උපදෙස් ලබා දී ඇති බවත්, කොවිඩ් කමිටු රැස්වීමට මසකට වරක් පමණක් සහභාගි වීම ප්‍රමාණවත් බවටත් උපදෙස් දී ඇති බව ලිඛිතව දන්වන ලදී.

ඒ හේතුවෙන් මෙම මාහැඟි ස්වේච්ඡා රෝගී සත්කාර සේවාව ඉදිරියට යාමට නොහැකිව මේ වනවිට නතරවී ඇත.

Scanned with CamScanner

කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරයාගේ අදහස වී ඇත්තේ මෙම ස්වේච්ඡා වැඩසටහනට සෞඛ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්වරයාගේ අනුමැතියක් නොමැති බැවින් ඊට අවසරය ලබාදිය නොහැකි බවයි. කරුණු එසේනම් ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා කළ යුතුව තිබෙන්නේ රජයටත්, සෞඛ්‍ය සේවයටත්, රෝගීන්ටත් පහසුවක් වන මෙවන් ස්වේච්ඡා වැඩසටහනක් ඉක්මන් වී නතර කිරීමට කටයුතු කිරීම නොව ඉක්මණින් සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් උපදෙස් පතා සිටීමයි. එසේ නොකොට තම පහළ නිලධාරින්ගේ කැපවීම් සහගත සේවා කටයුතුද ඇණහිටින සේ උපදෙස් ලබා දී මෙම වැඩපිළිවළ නොසලකා හැරීම තුළ අපට නිරීක්ෂණය වන්නේ මම දුෂ්කර අවධියේ රජයත් සෞඛ්‍ය සේවයත් අපහසුවට ලක්කරන කිසියම් උවමනාවකින් හෝ පෙළඹවීමකින් මෙම සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා කටයුතු කරමින් සිටින බවයි.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල වලින් නියෝජිතයකු සහභාගි කර සතිපතා පැය දෙකක තත්ත්ව සමාලෝචනයක් කිරීමට කාලය ගැනීම ප්‍රදේශයේ සෞඛ්‍ය සේවා කටයුතු ඇණහිටීමට හේතුවක් නොවන බව  පැහැදිලි අතර මෙතෙක් එවන් බාධාවක් පවතින බවක් එම නිලධාරින් කොවිඩ් කමිටුව හමුවේ ප්‍රකාශකර නැත.

මෙම දුෂ්කර සමයේ රෝගී ජීවිත සම්බන්ධයෙන් අප කටයුතු කළ යුත්තේ නීති රීති, අණ පණත්, සම්ප්‍රදායන් තුළ සිරවී වැඩ කල්දැමීමට හේතු සොයමින් හෝ රුචි අරුචිකම්, උවමනාවන් තුළ කොටුවී වැඩ අතහරිමින් නොව සම්ප්‍රදායික රාමු ඉක්මවා රෝගී ජනතාවට සේවය සැපයීමට ඇති මංමාවත් විවෘත කර ගන්නේ කෙසේදැයි සොයා බලමිනි.

එම අර්ථයෙන් ගත් කළ පානදුර කොවිඩ් කමිටුවෙන් සැලසුම් කර ඇති ''පානදුර කොවිඩ් රෝගීන් රැකබලාගැනීමේ ස්වේච්ඡා ව්‍යාපෘතිය'' පළමුව නියාමන ව්‍යාපෘතියක් ලෙස අප ප්‍රදේශයේ ක්‍රියාවට නංවා පසුව රටටම හඳුන්වාදිය හැකි වටිනාකමක් සහිත ව්‍යාපෘතියකි.

එබැවින් පවතින තත්ත්වය පිළිබඳ සොයා බලා දැනට නතරවී ඇති ''පානදුර කොවිඩ් රෝගීන් රැකබලා ගැනීමේ ස්වේච්ඡා ව්‍යාපෘතිය'' ක්‍රියාත්මක කිරීමට ඇති බාධා ඉවත්කර ගැනීමට ඉක්මණින් මැදිහත් වන ලෙස ඔබ තුමන්ගෙන් ඉල්ලා සිටිමු.

ස්තූතියි.
මෙයට - විශ්වාසී,

ජයන්ත සමරවීර
ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම්
සහ බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍ය
අංක 45, ලේඩින් බැස්ටියන් පාර,
කොළඹ 01.

ජයන්ත සමරවීර (පා.ම.)
ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් සහ
බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍ය

පිටපත් :

1. බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා
2. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
3. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
4. දිස්ත්‍රික් ලේකම්, කළුතර
5. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - බස්නාහිර පළාත
6. ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ, කළුතර
7. ප්‍රාදේශීය ලේකම්, පානදුර
8. නියෝජ්‍ය සභාපති - පානදුර කොවිඩ් කමිටුව, හිටපු පළාත් සභා මන්ත්‍රී ගරු ජගත් අංගගේ මැතිතුමා
9. සාමාජික - පානදුර කොවිඩ් කමිටුව, හිටපු පළාත් සභා මන්ත්‍රී ගරු විකුම් ගුණසේකර මැතිතුමා
10. සාමාජික - පානදුර කොවිඩ් කමිටුව, හිටපු පළාත් සභා මන්ත්‍රී ගරු නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු මැතිතුමා

Scanned with CamScanner